සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක 29/2025 (I)

මගේ අංකය : PPSC/ES/05/FI/06/02
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත
පළාත් සභා සංකීර්ණය
නවනගරය- රත්නපුර
2025.12. 01

සබරගමුව පළාත් සභාවේ

01. ප්‍රධාන ලේකම්
02. ආණ්ඩුකාරවර ලේකම්
03. සභා ලේකම්
04. සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් / නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්
05. පළාත් පාලන ආයතන ප්‍රධානීන් සහ අනෙකුත් ආයතන ප්‍රධානීන් වෙත

**කුසලතා පදනම මත සබරගමුව පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගය - 2025**

උක්ත විභාගයට අදාලව **2025.11.13** දිනැතිව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 29/2025 පහත පරිදි සංශෝධනය කෙරේ.

I. චක්‍රලේඛයෙහි 05 වන වගන්තිය (සුදුසුකම්) යටතේ ඇති (III) වන කරුණට පසු පහත අතිරේක සටහන ඇතුලත් කරනු ලැබේ.

**"අතිරේක සටහන - 2025.11.22 දින පැවති කළමනාකරණ සේවා නිලධාරී I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිට ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින නිලධාරීන්ට ද මෙම විභාගය සඳහා අයදුම් කළ හැකිය. එසේ වුවද, යම් නිලධාරියෙකු එම කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වීමට අපොහොසත් වුවහොත් කුසලතා පදනම මත අධි ශ්‍රේණියට උසස් කිරීමේ මෙම තරග විභාගයෙන් සමත් වුවද අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා සුදුසුකම් නොලබනු ඇත."**

II. අයදුම්පත් කැඳවන අවසන් දිනය **2025.12.15** දක්වා දීර්ඝ කරනු ලැබේ.ඒ අනුව අයදුම්කරුවන් 2025.12.15 දින වන විට ඉහත චක්‍රලේඛය මගින් අපේක්ෂිත සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

III. චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

IV. මෙම නිවේදනය www.psc.sg.gov.lk යන වෙබ් අඩවියේ පළ කරන අතරම, ඔබ ආයතනයට අනුයුක්තව ඇති සියලුම ආයතනවල අදාළ නිලධරයන්ගේ දැනගැනීම සඳහා ද හැකි ඉක්මනින් මෙය යැවීමට කටයුතු කළ යුතු වේ.

ඩබ්.ආර්.දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත